# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2031/4 – 2017 අගෝස්තු මස 08 වැනි අඟහරුවාදා – 2017.08.08

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංක IR/10/19/2012.

<u>කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරිය</u>

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2014.04.17 දිනැති හා අංක 1858/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ* ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2014.04.01 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කැස්බෑව, බණ්ඩාරගම පාර, විලියම් ජයසූරිය මාවත, ග්‍රීන්වේ ටෙරස්, අංක 213/1 හි පදිංචි එස්. එම්. සී. කුමාරගේ මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 15, රොක්හවුස් පටුමග, අංක 15 හි පිහිටි ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2017.03.20 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල් *(වැඩ බලන).*

2017 ජූලි මස 28 වැනි දින,
කොළඹ 05, කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*යොමු අංකය:* IR/10/19/2012.

**කාර්මික අධිකරණයේ දී ය**

එස්. එම්. සී. කුමාරගේ,
අංක 213/1, ග්‍රීන්වේ ටෙරස්,
විලියම් ජයසූරිය මාවත,
බණ්ඩාරගම පාර,
කැස්බෑව.

පළමු පාර්ශ්වය
සහ

*නඩු අංකය :* **A 3552**

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව,
අංක 15,
රොක්හවුස් පටුමග,
කොළඹ 15.

දෙවන පාර්ශ්වය

අතර පවතින ආරවුල,

ප්‍රදානය

කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍ය ගරු ගාමිණී ලොකුගේ මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 04 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධනය වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාරව උක්ත ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2014.04.08 දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කොට මා වෙත යොමු කර ඇත.

ආරවුලට හේතු වී ඇති කාරණය

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝගය ප්‍රකාර ව ඉහත සඳහන් දෙපාර්ශ්වය අතර උද්ගත වී ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය වනුයේ: ''ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවෙහි සේවය කළ එස්. එම්. සී. කුමාරගේ මහතාට 2009.12.03 දින සිට 2011.10.30 දක්වා කාලයට හිඟ වැටුප් සහ අනෙකුත් දීමනා නොගෙවීමෙන් ඔහුට යම් අසාධාරණයක් සිදු වූයේ ද යන්න හා එලෙස අසාධාරණයක් සිදු වූයේ නම් ඔහුට කුමන සහනයක් හිමි විය යුතු ද යන්න පිළිබඳව වේ''ය.

පෙනී සිටීම

මෙම බේරුම්කරණ විෂයයෙහි පළමුවැනි පාර්ශ්වය ලෙස තමාට අසාධාරණයක් සිදුවී යයි පවසමින් සහනයක් පතන එස්. එම්. සී. කුමාරගේ මහතා බේරුම්කරණ විභාගය පුරාම ඊට සහභාගී විය. පළමුවැනි පාර්ශ්වයේ එකී ඉල්ලුම්කරු වෙනුවෙන් ඔහුගේ බලය පවරන ලද නියෝජිත ජී. ඩබ්ලිව්. ශ්‍රේෂන් ද සිල්වා මහතා 2015 ජනවාරි මස 21 දින සිට විභාගය අවසන් වන තුරු පෙනී සිටියේ ය.

දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ මානව සම්පත් කළමනාකරු සමන්ත තුෂාර ගල්පාය මහතාත්, ජ්‍යෙෂ්ඨ පිරිස් පාලන නිලධාරි ඩී. එම්. එස්. විජේතුංග මහතාත්, දිලිනි වත්සලා මහත්මියත් වරින්වර පෙනී සිට ඇත. දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් ආයතනයේ නීති නිලධාරිනී නීතිඥ මාලිකා උදයංගනී මහත්මිය සමග මුල් අවස්ථාවේ දී නීතිඥ තරංග හේවාවසම් මහතා පෙනී සිටි අතර 2015 අප්‍රේල් මස 24 දින සිට පරීක්ෂණය අවසාන වන තෙක් නීතිඥ සමන් ගලප්පත්ති මහතා පෙනී සිටියේ ය.

බේරුම්කරණයේ විභාගය පැවැත්වූ පටිපාටිය

මෙම බේරුම්කරණ විභාගය 2014.07.01 දින පළමු වතාවට කැඳවනු ලැබුණි. 2014.09.09 දින පරීක්ෂණ විභාගය කැඳවූ අවස්ථාවේ දී පළමු ප්‍රකාශයන් පාර්ශ්වයන් දෙකට ම හුවමාරු කර භාරදෙනු ලැබුණි. ඒවාට පිළිතුරු දෙමින් පාර්ශ්වයන් විසින් ඉදිරිපත් කරන ලද දෙවැනි ප්‍රකාශ 2014.10.14 වැනි දින දෙපාර්ශ්වයට ම හුවමාරු කර භාර දෙන ලදී. ඒවා ද සැලකිල්ලට ගෙන විභාගයකට අවතීර්ණ නොවී දෙපාර්ශ්වයේ එකඟතාව මත කිසියම් සාධාරණ සමථයකට එළඹිය හැකි ද යන්න පිළිබඳ උත්සාහයක් ගන්නා ලදී. එබඳු සමථයකට දෙපාර්ශ්වය ගෙන ඒම අපහසු වූයෙන් විභාගය ඇරඹුණි. බේරුම්කරණ විභාගය වාර 14 කට කැඳවන ලදී.

බේරුම්කරණයේ ආරම්භයේ දී ම විභාග කටයුතු අනවශ්‍ය ලෙස දිග්ගැස්සීම වැළැක්වීමේ සහ ඉලක්කගත ව සිදු කිරීමේ අරමුණෙන් බේරුම් කළ යුතු නිමිත්තට අදාළ පිළිගැනීම් සහ විසඳිය යුතු කරුණු පිළිබඳව පාර්ශ්වයන් සමගා දළ වශයෙන් එකඟතාවකට එළඹුණි.

පළමුවැනි පාර්ශ්වය වශයෙන් වන සහනයක් ඉල්ලන එස්. එම්. සී. කුමාරගේ මහතා 2015.04.14 දින සාක්ෂි දීම සඳහා කැඳවනු ලැබුණි. එදින ම ඔහුගේ මූලික සාක්ෂි විභාගයත්, දෙවන පාර්ශ්වයේ නීතිඥ මහතාගේ හරස් ප්‍රශ්න විභාගයත් අවසන් කරන ලදී. පළමු වැනි පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නියෝජිත මහතා ඔහුගෙන් නැවත ප්‍රශ්න විමසීමක් කළේ නැත.

දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ මානව සම්පත් කළමනාකරු සමන්ත තුෂාර ගල්පාය මහතාත්, ආයතනයේ මාණ්ඩලික නිලධාරිනියක වන සී. එම්. පී. ජානකී මහත්මියත් සාක්ෂි දීම සඳහා කැඳවනු ලැබිණි.

නිරීක්ෂණ

- උපාධිධාරීන්ට රජයේ රැකියා සැපයීමේ වැඩපිළිවෙල යටතේ 2006.07.24 වැනි දින ඉල්ලුම්කරු කුමාරගේ මහතා ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ ව්‍යාපෘති සහකාර තනතුරකට වසර තුනක පරිවාස කාලයකට යටත්කොට බඳවා ගනු ලැබුණි.

- 2009.11.03 දින සිට ක්‍රියාත්මකවන පරිදි ඔහු ආයතනයේ පිරිස් පාලන නිලධාරී 111 ශ්‍රේණියේ තනතුරකට පත් කරනු ලැබ ඇත.

- උපාධිධාරීන්ට රැකියා සැපයීමේ වැඩපිළිවෙල යටතේ ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවට එම වකවානුව තුළ බඳවා ගත් සෙසු උපාධිධාරීන්ට ඔවුන්ගේ යෝග්‍යතාව සලකා බලා උසස් වීම් ලබා දී ඉහළ වැටුප් ලක්ෂ්‍යයන්හි පිහිටුවා විවිධ තනතුරු පිරිනමා ඇති බව අනාවරණය විය.

- අනෙකුත් නිලධාරීන් එසේ සුදුසුකම් මත විවිධ තනතුරුවලට පත් කළා සේ පිරිස් පාලන අංශයේ සේවය කළ පිරිස් පාලන නිලධාරීන් දෙදෙනෙකු වූ එස්. එම්. සී. කුමාරගේ මහතාත්, ඩී. එම්. එස්. කේ. විජේතුංග මහතාත් යන දෙදෙනා එක් ව තමන් ද නියමිත වැටුප් තලවල පිහිටුවීමට කටයුතු කරන ලෙස ඉල්ලා 2011.09.26 දින ලිපියක් පාලනාධිකාරියට ඉදිරිපත්කර ඇත.

- එකී ඉල්ලීම ඇතුලත් ලිපියේ පිටපතක් පළමුවැනි පර්ශ්වය විසින් A2 වශයෙන් ලකුණුකර ඉදිරිපත් කරන ලද අතර, එම ලිපියේ පහළින් සටහන් දෙකක් දක්නට ලැබේ. එකී සටහන් දෙක මෙසේ ය.

1. ''<u>GM</u>/ වැටුප් සංශෝධනය කිරීම සුදුසු බව නිර්දේශ කරමි. ඉදිරි කටයුතු සඳහා උපදෙස් පතමි''.
2. ''<u>HRM</u>/දැනට ලබා දී ඇති ශ්‍රේණියේ වැටුප් ලක්ෂ්‍යය ලබා දීම අනුමත කරමි.''

මින් 1 වැනි සටහන ආයතනයේ මානව සම්පත් කළමනාකරු විසින් තබා ඇති බවටත්, 2 වැනි සටහන ආයතනයේ සාමාන්‍යාධිකාරි විසින් තබා ඇති බවටත් සාක්ෂි මගින් තහවුරු කෙරුණි. 2015.08.11 දිනැති කාර්ය සටහන් පිටු අංක : 3, 4 සහ 5 හි දී දෙවැනි පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි දුන් ආයතනයේ මානව සම්පත් කළමනාකරු සමන්ත තුෂාර ගල්පාය මහතා පළමුවැනි පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටි නියෝජිත විසින් අසන ලද හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් එම කරුණු පිළිගෙන ඇත.

එකී A2 ලේඛනයේ අඩංගු ලිපියෙන් ඉල්ලුම්කරු සහ තම සගයා වන විජේතුංග මහතාගේ අත්සනින් ඉදිරිපත් කර ඇති ඉල්ලීමත්, ඉහතින් සඳහන් කරන ලද අංක : 1 හා 2 දරන සටහන් දෙකක් මෙම බේරුම්කරන විභාගයේ විනිශ්චයට ඉතා වැදගත් වේ.

තවදුරටත් එකී සටහන් දෙකෙන් ගම්‍ය වන දේ පිළිබඳ ව මානව සම්පත් කළමනාකරු එහි දී ලබා දී ඇති සාක්ෂිය ද ඉතා වැදගත් ය.

මෙම සටහන් දෙකෙන් ගම්‍ය වන දේ වෙනස් අයුරකින් අර්ථ ගැන්වීමට 2015.10.23 වැනි දින සාක්ෂිකරුගෙන් නැවත සාක්ෂි විභාගයේ දී උත්සාහයක් ගෙන ඇත. (කාර්ය සටහන් පිටු අංක : 2, 3 හා 4) එකී A2 ලේඛනයේ ඇති ඉල්ලුම්කරු කුමාරගේ මහතාගේත්, විජේතුංග මහතාගේත් ඒකාබද්ධ ඉල්ලීමට අදාල ව එකී ලිපියේ යොදා ඇති ඉහතින් සඳහන්කර ඇති සටහන් දෙක ඉතා පැහැදිලි ය. 1 වැනි සටහනෙන් මානව සම්පත් කළමනාකරු විසින් එකී එකාබද්ධ ඉල්ලීමට අනුව වැටුප් සංශෝධනය කිරීම <u>නිර්දේශ කොට ඇති</u> අතර සාමාන්‍යාධිකාරි විසින් එය <u>අනුමත කර</u> ඇත.

සාමාන්‍යාධිකාරි විසින් කර ඇත්තේ නිර්දේශ කිරීමක් යයි සාක්ෂිකරු ගල්පාය මහතා පුන පුනා පිළිතුරු දී ඇතත් එහි ස්වභාවයෙන් සහ වචනාර්ථයෙන් ම ''අනුමත කරමි'' යන්න නියෝගයකි. එය නිර්දේශයක් ලෙස කිසිසේත් සැළකිය නොහැක. එය නිර්දේශයක් නම් සටහන ආමන්ත්‍රණය කළ යුතු වූයේ තමාට ඉහළ ධුරයක සිටින සභාපතිවරයාට ය. එහෙත් සාමාන්‍යාධිකාරිවරයා එසේ සභාපතිවරයාගේ නියෝග පතා ඇති බවක් එකී සටහන්වලින් නොකියවෙන අතර, ඉතා පැහැදිලි කරුණ ලෙස දැක්විය හැක්කේ කාරණය නිර්දේශ කරනු ලැබ ඇති මානව සම්පත් කළමනාකාරවරයාට (තමා යටතේ කටයුතු කරන නිලධාරියෙකු වන) දී ඇති නියෝගයකි.

මෙම සටහන බෙහෙවින් වැදගත් වන්නේ ඉහත සඳහන් A2 ලිපියෙන් ඉල්ලීම කරන ලද නිලධාරීන් දෙදෙනා අතුරෙන් (ඉල්ලුම්කරු අත් හැර) අනෙක් නිලධාරියා වන විජේතුංග මහතාට ඉල්ලා සිටින ලද වැටුප් තලයේ පිහිටුවීම කරන ලද බව A6 ලෙස පළමුවැනි පාර්ශ්වය විසින් ලකුණු කරන ලද ලිපියෙන් සනාථ වන නිසා ය. එකී විජේතුංග මහතා අමතා ඇති A6 ලෙස ලකුණු කළ ලිපියේ මුල් ඡේදයේ මෙසේ සඳහන් වේ.

''උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් සමාන්‍යාධිකාරි වෙත යොමු කරන ලද 2011.09.26 දිනැති ලිපිය හා බැඳේ''

මෙහි දී සාමාන්‍යාධිකාරිවරයා යොමුව දී ඇත්තේ A2 හි ඒකාබද්ධ ඉල්ලීම් ලිපියටයි. එසේම විජේතුංග මහතා වැටුප් ලක්ෂ්‍යයේ පිහිටවමින් එකී A6 ලිපිය නිකුත්කර ඇත්තේ 2011.11.14 දින දී වීම ද, විශේෂයෙන් වැදගත් වේ.

මෙහි දී සුවිශේෂ සිද්ධියක් වී ඇත්තේ එම A2 ලිපිය ඒකාබද්ධ ව ඉදිරිපත් කළ කුමාරගේ මහතා විසින් R11 ලෙස දෙවන පාර්ශ්වයෙන් ලකුණු කළ ලිපිය මගින් එදින ම එනම් 2011.11.14 දින ම සේවයෙන් ඉල්ලා අස් වීමේ ලිපියක් ඉදිරිපත් කිරීමයි. තමා 2011.12.14 දින සිට බලපැවැත්වෙන පරිදි සේවයෙන් ඉල්ලා අස් වන බව කුමාරගේ මහතා එකී ලිපියෙන් පාලනාධිකාරියට දන්වා ඇත. R12 ලෙස දෙවන පාර්ශ්වයෙන් ලකුණු කරන ලද ලිපියෙන් 2011.12.14 දින සිට ක්‍රියාත්මක වන සේ කුමාරගේ මහතාගේ ඉල්ලා අස්වීම භාර ගෙන ඇත. විජේතුංග මහතාගේ වැටුප් තලයෙහි පිහිටුවීමේ නියෝගය සම්බන්ධයෙන් ද, ඉහතින් සඳහන් කරන ලද සාමාන්‍යාධිකාරි වරයාගේ ''අනුමත කිරීමට'' ඔබ්බෙන් සභාපතිවරයාගේ අනුමැතියක් ලබා ගෙන ඇති බවට කරුණු ඉදිරිපත් නොවුණි. තව ද ආයතනයේ මානව සම්පත් කළමනාකරු 2015.10.23 දින දෙවැනි පාර්ශ්වයේ නීතිඥවරයාගේ නැවත ප්‍රශ්න විමසීමට දුන් පිළිතුරුවලින් මෙම කාරණය වඩාත් තහවුරු ව පෙනේ.

මේ අතරතුර පළමුවැනි පාර්ශ්වය බලවත් උත්සාහයක් ගත්තේ කුමාරගේ මහතාට ද මෙම වැටුප් තලයේ පිහිටුවීමට අදාල තීරණය පාලනාධිකාරයෙන් ගත් බවත්, වෙනෙකක් තබා අදාල තීරණය දැන්වීමට ලිපියක් ද යතුරු ලියන ලේඛනයේ අංක : CF/ HC/ HR/ 2067 යටතේ යතුරු ලියා සකස් කරන ලද බවත් ය. එහෙත් එම කාරණය සාර්ථක ලෙස ඔප්පු කිරීමට පළමුවන පාර්ශ්වය සමත් නොවී ය.

කෙසේ වුවත් 2011.11.14 දින ඉල්ලා අස්වීමේ ලිපිය ඉදිරිපත්කළත් කුමාරගේ මහතා 2011.12.14 දින දක්වා සේවයේ යෙදී සිට ඇත. කුමාරගේ මහතා මෙකී වැටුප් තලයේ නොපිහිටවීමට හේතුවන විශේෂ හේතුවක් ඉදිරිපත් කිරීමට ද, දෙවන පාර්ශ්වය උත්සහ ගත්තේ නැත. එම නිසා මෙම සාධක අතුරෙන් ගම්‍ය වන ඉතා පැහැදිලි කරුණක් වන්නේ මෙම වැටුප් තලයේ පිහිටුවීම විජේතුංග මහතාට මෙන් ම කුමාරගේ මහතාට ලබා දීමට පාලනාධිකාරිය කටයුතු කළත් ඔහු ඉල්ලා අස්වීමේ ලිපියක් ඉදිරිපත් කළ නිසා එය ලබා නොදුන් බවයි. ඒ බව දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද පළමුවැනි ප්‍රකාශයේ අංක 16 සහ 7 යටතේත් දෙවන ප්‍රකාශයේ අංක : 7 යටතේත්, පැහැදිලි ව දක්වා ඇත. දෙවන පාර්ශ්වයේ අවසන් ලිඛිත සැළකිරීමෙහි (පිටු අංක : 2 හි) ද ඒ බව මූලික විරෝධතාවක් වශයෙන් දක්වා ඇත.

තවදුරටත් දෙවන පාර්ශ්වය ගෙන ඇති ස්ථාවරයක් වන්නේ ඉල්ලා අස්වීමට පෙර නිලධාරියෙකු විසින් කරන ලද සේවාවන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් ලැබෙන සියලුම ප්‍රතිලාභ සහ හිමිකම් එසේ ඉල්ලා අස් වීමෙන් පසු ව නිලධාරියෙකුට අහිමි වන බව ආයතන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ 4:6 වගන්තියේ දැක්වෙන බවයි. පළමුවන පාර්ශ්වය මේ සම්බන්ධයෙන් හබ කරමින් තම අවසන් සැළකිරීම්වල ගෙන හැර දක්වා ඇත්තේ ආයතන සංග්‍රහයේ ''රජයේ නිලධාරියා'' යන්නට කුමාරගේ මහතා ඇතුලත් නොවන බවයි. (පළමුවැනි පාර්ශ්වයේ සැළකිරීම්වල පිටු අංක :3) ආයතන සංග්‍රහයේ අර්ථකථනයන්ට අනුව සංස්ථා සේවකයින් රජයේ නිලධාරි ගණයට අයිති නොවන බැවින් එහි V වැනි පරිච්ඡේදයේ 4:6 වගන්තියෙන් කුමාරගේ මහතා ආවරණය නොවන බව කියා සිටී. අනෙක් අතට ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සේවක මණ්ඩල පාලනයට ගුරු කර ගන්නේ ආයතන සංග්‍රහය බවට එහි අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ගෙන ඇති බවක් දෙවන පාර්ශ්වය විසින් තහවුරු කර නැත.

විජේතුංග මහතාට ඉහළ වැටුප් තලයක පිහිටුවීමේ වාසිය ලබා දෙන ලද A6 ලේඛනය නිකුත් කර ඇත්තේ 2011.11.14 වැනි දින දී වන අතර ඒ දිනය වන විටත්, ඉන් ඔබ්බට තවත් මාසයක් ගත වන තුරුත් ඉල්ලුම්කරු කුමාරගේ මහතා සේවයේ යෙදී සිට ඇත.

පොදුවේ ගත් කළ බේරුම්කරණ පරීක්ෂණයේ සාක්ෂි විභාගයේ දී නිරීක්ෂණය කෙරුණු විශේෂ කාරණයක් වූයේ දෙවැනි පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂිකරුවන් විශ්වාසයකින් සාක්ෂි නොදුන් බවයි. ඇතැම් විට ඔවුන් සාක්ෂි දුන්නේ පැකිළෙමිනි. තවත් අවස්ථාවල ඔවුන්ගේ සාක්ෂි පරස්පර ඒවා විය. එම නිසා දෙවන පාර්ශ්වය වෙනුවෙන් ඉදිරිපත් කරන ලද සාක්ෂිකරුවන්ගේ සාක්ෂිවල විශ්වාසනීයභාවයට ඉන් බලපෑමක් කෙරුණි.

<u>නිගමනයන්</u>

ඉල්ලුම්කරු ඇතුළු සමාන පසුතලයක් ඇති නිලධාරීන් දෙදෙනෙකු විසින් එක ම ඉල්ලීම් ලිපියකින් ඒකාබද්ධ ඉල්ලීමක් ඉදිරිපත්කර ඇති අවස්ථාවක ඉන් එක් අයෙකු පමණක් ඉහළ වැටුප්තලවල පිහිටුවා, විනය හෝ අකාර්යක්ෂමතාව වැනි හෝ හේතුවක් නොමැති ව පාලනාධිකාරියේ අභිමතය මත ඉල්ලුම්කරුට එකී වැටුප්තලවල වාසිය ලබා නොදීමෙන් අසාධාරණයක් සිදු වූ බව.

වසර ගණනක් සේවයකොට ඉල්ලා අස් වී යන සේවකයෙකු වන ඉල්ලුම්කරුට එක් වරක් පමණක් ගෙවීමට සිදුවන ගෙවීමක් වීම නිසා එකී වැටුප් තල වල පිහිටුවා එහි වාසි ලබා දීම සාධාරණ බව.

විජේතුංග මහතාට හිමි කර දුන් වැටුප් තලයක පිහිටුවීමේ වාසි බලපැවැත්වෙන දිනය වන 2009.12.03 වැනි දින සිට කුමාරගේ මහතාට ද එකී වාසි ලබා දීම සුදුසු බව.

ඒ අනුව පිහිටුවනු ලබන වැටුප් තලයන් පදනම් කරගෙන ආයතනයේ ගණකාධිකාරි විසින් A4A ලෙස ලකුණු කළ ලේඛනයේ සඳහන් ආකාරයට ගණනය කරන ලද පරිදි අදාල ඉහළ වැටුප් තලයේ පිහිටුවීමේ වාසි කුමාරගේ මහතාට ලබාදීම සුදුසු බව.

කුමාරගේ මහතාගෙන් ආයතනයට අය විය යුතු සියලු මුදල් අයකර ගත යුතු බව.

බේරුම්කරණ යොමුවේ ආරවුලට අදාල කාල සීමාව 2009.12.03 දින සිට 2011.10.30 ලෙස දක්වා ඇතත් විභාගයේ දී ඉදිරිපත් වූ කරුණු අනුව කුමාරගේ මහතාට දිය යුතු සහනයන් 2011.12.13 දක්වා ලබා දීම යෝග්‍ය බව.

<u>ප්‍රදානය</u>

1. පළමුවන පාර්ශ්වයේ ඉල්ලුම්කරු එස්. එම්. සී. කුමාරගේ මහතා 2009.12.03 දිනට රු.26,925/= ක් වූ වැටුප් තලයේ පිහිටුවා, 2011.10.30 දින දක්වා කාලයට අදාල පරිදි ගණනය කරනු ලබන හිඟ වැටුප් මුදල් ශේෂයන් ඔහුට ගෙවිය යුතු ය.

2. ඒ වැටුප් තලය පදනම් කරගෙන 2011 නොවැම්බර් මාසයටත්, 2011.12.01 දින සිට 2011.12.13 දක්වා කාලයටත් හිඟ වැටුප් ගණනය කර ඔහුට ගෙවිය යුතු ය.

3. පිහිටුවන ලබන වැටුප් තලයට අදාල ව නියමිත ජීවන අංක දීමනා, විශේෂ දීමනා ආදී සියලු දීමනා ගණනයකොට ගෙවිය යුතු ය.

4. ඊට අනුකූලව 2009, 2010 හා 2011 වර්ෂවල හිඟ වෛද්‍ය නිවාඩු සඳහා ඔහුට ගෙවිය යුතු ගෙවීම් ගෙවිය යුතු ය.

5. 2012 වර්ෂයට අදාලවන කුමාරගේ මහතාට හිමිවන ලබා නොගත් නිවාඩු සඳහා ගෙවිය යුතු දීමනා ඔහුට ගෙවිය යුතු ය.

6. අදාල වන අවසාන වැටුපට අනුව ගණනය කළ යුතු වන පාරිතෝෂික දීමනා කුමාරගේ මහතාට ගෙවිය යුතු ය.

7. අදාල පරිදි ගෙවිය යුතු සේවක අර්ථ සාධක අරමුදල් සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් ප්‍රතිලාභ ඔහුට ගෙවිය යුතු ය.

8. බේරුම්කරණ විභාගය සම්බන්ධයෙන් කිසිදු වියදමක් එක් පාර්ශ්වයකින් අනෙක් පාර්ශ්වයකට හිමි නොවිය යුතු ය.

9. කුමාරගේ මහතාගෙන් ආයතනයට අය විය යුතු ආපදා ණය, විශේෂ ණය සහ උත්සව අත්තිකාරම් ගණනය කොට අය කර ගත යුතු ය.

10. මෙම ප්‍රදානයන් ගැසට් පත්‍රයේ පළ වූ දිනයේ සිට මසක් ඇතුලත මෙහි ඉහත 9 වැනි ප්‍රදානයට අදාල මුදල් ප්‍රමාණය අඩු කොට කුමාරගේ මහතාට හිමි ලෙස ඉහතින් දැක්වූ ගෙවීම්වලට අදාල මුදල් උතුරු කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.

එස්. විරිතමුල්ල,
බේරුම්කරු.

2017 මාර්තු මස 20 වැනි දින,
කාර්මික අධිකරණයේ දී ය.

08 – 749

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.